ආමුණුම් අංක 02

# අධ්‍යාපන අමාත්‍යාංශය
# கல்வி அமைச்சு
# Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்லை, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ යොමුව<br>எனது இல.<br>My Ref. | ED/04/58/20/ජාතිකපාසල්-SLEAS/2024 | ඔබේ යොමුව<br>உமது இல.<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2024.04.25 |

නම

සම්මුඛ පරීක්ෂණ අංකය

**ජාතික පාසල්වල පුරප්පාඩු වී ඇති විදුහල්පති තනතුරු සඳහා නිලධාරීන් තෝරා පත් කිරීමේ සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීම - ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය I**

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ නියමය පරිදි දිවයින පුරා පිහිටි ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1 ශ්‍රේණියේ නිළධාරියෙකු විදුහල්පති ධූරය දැරිය යුතු ජාතික පාසල් 50 ක විදුහල්පති පුරප්පාඩු සම්පූර්ණ කිරීමේ සම්මුඛ පරීක්ෂණ සඳහා ඔබ කැඳවනු ලබන බව සතුටින් දන්වා සිටිමි.

02. ඒ සඳහා ඉසුරුපාය, අධ්‍යාපන අමාත්‍යාංශයේ 04 වන මහල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශාඛාවට අයත් රැස්වීම් ශාලාවට ……………..... දින පෙ.ව.8.30 ට පැමිණෙන ලෙස කාරුණිකව දන්වා සිටිමි. එදිනට පහත සඳහන් ලිපි ලේඛනවල මුල් පිටපත් හා ආයතන ප්‍රධානියා විසින් සහතික කරන ලද අදාළ සහතිකවල ඡායා පිටපත් (අංක I සිට XVI දක්වා ලේඛන) ගොනුවක් පහත සඳහන් අනුපිළිවෙලට සකස් කර ඔබගේ නම හා සම්මුඛ පරීක්ෂණ අංකය සඳහන් කර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

I. සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීමේ ලිපිය
II. ජාතික හැඳුනුම්පත
III. නමෙහි වෙනසක් පවතී නම් පමණක් ඒ සඳහා දිවුරුම් ප්‍රකාශය
IV. මුල් පත්වීම් ලිපිය
V. පත්වීම ස්ථිර කිරීමේ ලිපිය
VI. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ II ශ්‍රේණියට උසස් කිරීමේ ලිපිය
VII. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ පත්වීම සඳහා අදාළ කරගන්නා ලද මූලික උපාධිය/ගුරු පුහුණු සහතිකය/ ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව
VIII. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ II ශ්‍රේණියට උසස් කිරීම සඳහා අදාළ කරගන්නා ලද අධ්‍යාපනවේදී උපාධිය / පශ්චාත් උපාධිය / පශ්චාත් උපාධි ඩිප්ලෝමා / අධ්‍යාපන කළමනාකරණ හෝ බඳවාගත් විෂයට අදාළ පශ්චාත් උපාධි ඩිප්ලෝමා හෝ පශ්චාත් උපාධි සහතිකය
IX. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියට උසස් කිරීම සඳහා අදාළ කරගන්නා ලද පශ්චාත් උපාධි සහතිකය
X. II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් නිදහස් කළ බවට නිකුත් කළ ලිපිය
XI. ඉහත X නිදහස් කිරීමට අදාළ අධ්‍යාපනවේදී උපාධි/ අධ්‍යාපන කළමනාකරණ පිළිබඳ උසස් ඩිප්ලෝමා /පශ්චාත් උපාධි ඩිප්ලෝමා /පශ්චාත් උපාධි සහතිකය
XII. ජ්‍යෙෂ්ඨතාවය සනාථ කිරීම සඳහා (ලකුණු පටිපාටියේ අනු අංක 01 අනුව)

a) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියට උසස් කළ ලිපිය
b) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට බඳවාගත් දින සිට අයදුම්පත් කැඳවන අවසාන දිනය දක්වා දැරූ තනතුරු හා එක් එක් තනතුර දැරූ කාලපරිච්ඡේද වෙන වෙනම සඳහන් කරමින් පෞද්ගලික ලිපිගොනුව ආශ්‍රයෙන් ලබාගත් සේවා සහතිකය

XIII. පාසල් කළමනාකරණය පිළිබඳ සේවා පළපුරුද්ද ( ලකුණු පටිපාටියේ අනු අංක 02 අනුව)

a) ස්ථිර විදුහල්පතිවරයෙකු, නියෝජ්‍ය විදුහල්පතිවරයෙකු වශයෙන් ජාතික/පළාත් පාසල් සඳහා පත්කිරීම්/ ස්ථාන මාරු කිරීම්වලට අදාළ ලිපි

2 වැනි පිටුවට.....

ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832 +94112784825 minister.education@moe.gov.lk
ලේකම් / செயலாளர் / Secretary
+94112784811 +94112785162 secretary.education@moe.gov.lk

b) ඉහත ලිපි නිකුත් කරන අවස්ථාවේ , අදාළ නිශ්චිත කාලසීමාවන් සහිතව පාසල් වර්ගීකරණය අනුව 1AB,1C පාසලක් වශයෙන් පැවති බවටත් හා එම ලිපි අත්සන් කර ඇත්තේ නියමිත බලධාරියා බවට සනාථ කරන ලිපි

c) නිශ්චිත කාලසීමාවන් ඇතුළත් පාසල් අධීක්ෂණ කටයතුවල නිරත වී ඇති බව / නිරත වන බව තහවුරු කරන ලිපි

XIV. අතිරේක අධ්‍යාපන සුදුසුකම් - ( ලකුණු පටිපාටියේ අනු අංක 03 අනුව)

(බඳවාගැනීම, II වන කාර්යක්ෂතා කඩඉම් පරීක්ෂණයෙන් නිදහස් කිරීමට අදාළ කර ගන්නා ලද සහතිකය හා ශ්‍රේණි උසස්වීම් සඳහා අදාළ කර ගන්නා ලද සහතික හැර වෙනත් අතිරේක අධ්‍යාපන සුදුසුකම්)

XV. සේවා ඇගයීම් - (ලකුණු පටිපාටියේ අනු අංක 06 අනුව)

XVI. ලකුණු පටිපාටියේ අංක 07 අනුව ඉදිරිපත් කිරීමට අදාළ දෑඩ පිටපත (පිටපතක් ගොනුවට ඇමිණිය යුතුය)

03. ලකුණු ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරනු ලබන ලේඛනයන්හි දකුණු පස ඉහළ කෙළවර ලකුණු පටිපාටියේ කුමන අනු අංකය යටතේ ලකුණු ලබා ගැනීමට ඉදිරිපත් කරන්නේද යන්න සඳහන් කර තිබිය යුතුය.

උදා - අතිරේක සුදුසුකම් සඳහා ඉදිරිපත් කරනු ලබන සහතික - අනු අංක 02

ඒ අනුව ඡායා පිටපත් ගොනුව සැකසීමෙන් පසු ගොනුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය. ප්‍රසිද්ධ කර ඇති ලකුණු පටිපාටියේ දක්වා ඇති 'සටහන්' කෙරෙහි මනා අවධානයෙන් යුක්තව ලේඛන ඉදිරිපත් කළ යුතුය.

04. ඉහත සම්මුඛ පරීක්ෂණය සඳහා 2024.02.28 දින අමාත්‍යාංශ වෙබ් අඩවියේ පළ කරන ලද නිවේදනය හා ලකුණු පටිපාටිය, නැවත සංශෝධනය කරන ලද අතර එම නිවේදනය හා ලකුණු පටිපාටියට අනුකූලව මෙම සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කරුවන් වෙත ලකුණු ලබා දීම සිදු කෙරේ. (2024.03.20 දිනැතිව ප්‍රසිද්ධ කරන ලද නිවේදනය හා 2024.02.29 දිනැතිව ප්‍රසිද්ධ කරන ලද ලකුණු පටිපාටියේ පිටපතක් මේ සමඟ අමුණා ඇත.)

05 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් අනුමත කරන ලද මේ සමඟ දක්වා ඇති ලකුණු පටිපාටියට අනුව, එම කමිටුව විසින් පත් කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් ලබා දෙනු ලබන ලකුණු මත ලබා ගන්නා සමස්ත කුසලතාවයේ ප්‍රමුඛතාවය, අයදුම්කරුගේ මනාපය, සේවා අවශ්‍යතාවය, අයදුම්කරු සම්බන්ධයෙන් පැවති/පවතින විනය කටයුතු, පාසලේ සංස්කෘතික පසුබිම/සම්ප්‍රදායන්, ඉගෙනුම් මාධ්‍ය, පාසල් කාණ්ඩය (බාලක/බාලිකා/මිශ්‍ර) සහ සලකා බැලිය යුතු වෙනත් කරුණු ද සැලකිල්ලට ගනිමින් අධ්‍යාපන ලේකම් විසින් ලබාදෙන නිර්දේශයන් ද මත පදනම්ව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් විදුහල්පති තනතුරු සඳහා සුදුසු නිලධාරීන් පත්කරනු ලැබේ.

06. අයදුම්කරුවන් අදාළ අයදුම්පත්‍රයේ මනාපය පළකරන ලද ජාතික පාසලක විදුහල්පති තනතුරකට පත්වීම් ලදහොත් අනිවාර්යයෙන්ම එම තනතුරෙහි රාජකාරී භාරගත යුතු බවත්, පිළිගත හැකි සාධාරණ හේතු නොමැතිව එම තනතුරේ රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කළ නොහැකි බවත්, පසුව අයදුම්පත්‍රයේ මනාපය වෙනස් කිරීම සඳහා කරනු ලබන ඉල්ලීම් සළකා නොලබන බවත්, වැඩිදුරටත් දන්වමි. තවද සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය අනුව කිසියම් පාසලක් හිමි නොවූ නිලධාරීන්, පුරප්පාඩු ලේඛනයේ සඳහන් විදුහල්පතිවරයෙකු තේරී පත් නොවූ වෙනත් පාසල් සඳහා ද පත් කිරීමට සළකා බලනු ලැබේ.

07. සම්මුඛ පරීක්ෂණයට සහභාගිවීම පමණක් පුරප්පාඩු වී ඇති ජාතික පාසලක විදුහල්පති තනතුරක් ලබා ගැනීම සඳහා හිමිකමක් නොවන බවද, දැනට පුරප්පාඩු වී ඇති ජාතික පාසල් විදුහල්පති තනතුරු සියල්ල සඳහාම නිලධාරීන් පත් කිරීමේ හෝ තනතුරු කිහිපයක් සඳහා පමණක් නිලධාරීන් පත් කිරීමේ අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව සතු වන බව ද, වැඩිදුරටත් අවධාරණය කරමි.

3 වැනි පිටුවට......

08. නියමිත දින මෙම සම්මුඛ පරීක්ෂණයට සහභාගී නොවන්නේ නම් ඒ සඳහා වෙනත් දිනයක් ලබා නොදෙන හෙයින් එවානි ඉල්ලීම් සලකා බලනු නොලබන බවද, අදාළ ලිපිලේඛන සම්මුඛ පරීක්ෂණයට සහභාගී වන අවස්ථාවේදී අනිවාර්යයෙන්ම ඉදිරිපත් කල යුතු බවද කාරුණිකව දන්වමි.

09. සම්මුඛ පරීක්ෂණයට සහභාගීවීම වෙනුවෙන් ගමන් වියදම් හෝ වෙනත් කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

ආචාර්ය අයි.එම්.කේ.බී.ඉලංගසිංහ
අතිරේක ලේකම් (අධ්‍යාපන සේවා ආයතන)
අධ්‍යාපන ලේකම් වෙනුවට

අ.කළේ :- ජේ.එම්.තිලකා ජයසුන්දර
ලේකම්